සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

47 S

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

**සිංහල සාහිත්‍ය රසාස්වාදය**
இலக்கிய நயம் சிங்களம்
Appreciation of Sinhala Literary Texts

2019.12.10 / 1300 - 1610

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

※ **I** කොටසෙහි **1, 2** ප්‍රශ්නවලටත්, **II** කොටසෙහි **3** වැනි ප්‍රශ්නයටත්, **III** කොටසෙහි **4, 5, 6, 7** ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා, ඒවා ඇසුරින් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** ලියන්න.

(i) "පිටිපස්සේ උන් ඇත්ගොව් ඉතාම චපලය, මට උසුළු විසුළු පැයේ ය."
(අ) මෙම ප්‍රකාශය කවුරුන් විසින් කරන ලද්දේ ද?
(ආ) මෙහි ඇත්ගොව්වා ලෙස පෙනී සිටියේ කවරෙක් ද?

(ii)
අමිත ගුණ නුවණ යුතු උතුමෝ පබඳ
අනත වෙහෙස ලදුවත් නොම වෙති දුහඳ
දිගත පතළ සුවඳැති සොඳ සඳුන් කඳ
සිදිත මඬින එක ලෙස පැතිරෙයි සුවඳ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.
(ආ) "අනත වෙහෙස ලදුවත් නොම වෙති දුහඳ" යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.

(iii) "කටේ හැටි කිරි අප්පුගෙ හොඹු කට වගෙයි"
(අ) මෙම ප්‍රකාශය කරනු ලබන්නේ කවුරුන් විසින් ද?
(ආ) මෙම ප්‍රකාශය අසා කෝප වන්නේ කවරෙක් ද?

(iv) "මේ තෙමේ සන්තක වස්තුවට තමා ආවේණිකව හිමි හෙයින් ඉල්වයි."
(අ) මෙම ප්‍රකාශයේ 'මේ තෙමේ' යනුවෙන් හැඳින්වෙන්නේ කවරෙක් ද?
(ආ) මෙය කවුරුන් විසින් කරන ලද ප්‍රකාශයක් ද?

(v) "මුත්තැහේලා සෙල්ලක්කාර තරුණ මහත්තුරු"
(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් නිර්මාණයේ රචකයා කවරෙක් ද?

(ලකුණු 04 × 5 = 20 යි.)

**2.** පහත සඳහන් පැදි පෙළ කියවා, දී ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන **රසාස්වාදයක්** ලියන්න.

වැහි වලා කුළ, පෑ කළු යෑ යි ඔබේ
නො හොබිති යි කිසි ලෙස් නො සතොස් නො වන්
සිරුරු පැයෙනු'ගත් සුදනෝ ලොවේ
නො හඳුනත් උතුමන් ගුණයෙන් විනා.

පැනැ - නැගී අහසේ පැතිරී ගොසින්,
මහ හිමත් සිඳුවා සත සිත් තොසින්,
කුඹුරු - වැව් පොකුණුත් පුරවා දියෙන්,
ලොවට දෙන්නා ඔබ යි අහරත් පැනුත්.

[දෙවැනි පිටුව බලන්න.

තද අසා ඔබ ගේ පැහැයත් බලා,
　　　　මොනරු පිල් විදහා රඟ දෙත් නදින්
අමුතුයෙන් පණවත් බව ලත් සෙයින්,
　　　　තුරු ලියත් ලිය-ලයි සැනැයී දියෙන්.

සුදු වලා කුළු බෝ මැ අහස් කුසේ
　　　　ඉහළ යෙයි; ඔබ යැම පහත් වැ මැ යි
එ පුදුමෙක් ද? උසස් නැණවත් දනෝ
　　　　ගුණ බරින් නැමුණෝ'ව් පවතිත් නිතින්.

කටට ගැන්ම ද බෝ මැ අමාරු වූ
　　　　කර දියත් ඔබ ගත් කලැ සාගරෙන්
මිහිරි වෙයි උතුමන් සහ වාසයෙන්
　　　　නිවටයෝ ද උසස් වෙති බෝ සෙයින්.

ගුණ බලා ඔබ ගේ ලො සබා දහම්
　　　　'ඔබැ'ට අන් කිසිවෙක් නිසි නැ' කියා
විදුලියත් පැහැ පත් රන දම් සෙයින්
　　　　පළඳවන්නෙ ඔබේ ගෙලෙ මැ යි බලන්.

(i) මෙම පැදි පෙළට පාදක වූ අත්දැකීම
(ii) මෙම පද්‍ය නිර්මාණයේ දී යොදා ගත් කාව්‍යෝක්ති
(iii) යොදා ගත් කාව්‍ය භාෂාව හා ආකෘතිය
(iv) වැහි වලා කුළෙන් ඇති ප්‍රයෝජන
(v) ශොබාදහමේ සොඳුරු බව

(ලකුණු 25 යි.)

## II කොටස

- පහත සඳහන් ගද්‍ය - පද්‍ය කොටස් දෙකෙන් **එක කොටසකට පමණක්** පිළිතුරු සපයන්න.

3. "තව ද ප්‍රභාවතීනි කුසරජ්ජුරුවන්ගේ යම් ගෘහෝද්‍යාන විද්‍යුල්ලතා සශ්‍රීක ව විරාජමාන වූ ස්වර්ණ මයූර රාජයන් විසින් මිහිඟු බෙර හඬින් මත් ව පවත්වන ලද කෙකානාදයෝ ද කොස්ලිහිණියන් විසින් පවත්වන ලද අනුරාගයෙන් හරිත වේ ද, එබඳු වූ ශ්‍රී සෞභාග්‍යය හා ඓශ්වර්ය විශේෂ ඇති ඒ කුසාවතී රාජධානියෙහි ඉසුරු හැර ඊට වඩා කවර සැපයෙක් කොයි ඇති හෙයින් මීට අවුද" යනාදීන් ප්‍රභාවතීන්ට අවවාද වශයෙන් කුසාවතියෙහි විභූතිය වර්ණනා කොට ඉදින් ඒ කුස රජ්ජුරුවෝ අද මෙතන වී නම් මේ සත්රජදරුවන් මරා ලුහුබඳවා මාගේ දියණියන්ට පැමිණි මේ දුක් දුරුකොට කැඳවා ගෙන යන්නෝ වේ ද, කපුටු රැසක් කැටක් ගසා පලවා ලන්නාක් මෙන් තමන්ගේ වචන මාත්‍රයකින් ම සකල ශත්‍රැ මර්දනය කරන්නා වූ ඉදින් සිතුව හොත් එක් සියක් රාජධානීනුත් හැර ගන්ට නිසි වූ සමර්ථ ඇති විශිෂ්ට වූ ප්‍රඥානුභාව ඇති ඒ කුස රජ්ජුරුවෝ අද මෙනුවර වූ නම් අප හැමට පැමිණි මේ දුකින් ගලවා ගන්නාහු යයි යනාදීන් කුස රජ්ජුරුවන්ගේ බොහෝ ගුණ කථනය කළාහු ය.

එකල්හි ප්‍රභාවතී තොමෝ "කුස රජ්ජුරුවන්ගේ ගුණ කියන්නා වූ මාගේ මෑණියන් වහන්සේගේ මුඛ නො සෑහෙන්නේ ය. එහෙයින් උන් වහන්සේ අරක්කැමි කොට මේ ගම වසන බව මෑණියන් වහන්සේට කියමි"යි සිතා "මෑණියන් වහන්ස, අනන්‍ය සාධාරණගුණගණාභරණවිභූෂිත ශෞර්‍යවීර්‍යබලපරාක්‍රමප්‍රතාපප්‍රඥාගුණ ඇති මේ සතුරන් නසා අප හැම රකින්ට නිසි වූ කුසරජ්ජුරුවන් වහන්සේ අපට ආළාරිකව මෙතන ම වාසය කරන සේක. උන් වහන්සේ කැඳවම්දැ"යි විචාළා ය.

ඉක්බිති "ප්‍රභාවතීනි, මරණභයින් පීඩිත ව නන්දොඩ වූ ද, අඥානයෙන් මුළා වූ ප්‍රලාප දොඩවු ද, බොළඳකමින් කිව මනා දෙය තබා අනිකක් කියවු ද තොප මේ කියන්නේ කිම් ද ඒ කුස රජ්ජුරුවෝ ඉදින් මේ නුවරට අවු නම් අපට නො දැනෙන්ට කාරණා කිම් ද ඉදින් එන් නම් අපට කියා එවා තමන්ගේ සේනාවාහනයන් පිරිවරා නේත් ද, මැගේ කුමන නන් දෙඩීමෙක් ද" යනාදීන් දෙඩූ ය

එසඳ ප්‍රභාවතී මෑණියන් වහන්සේ කුමක් කීවත් අදහා නො ගන්නා සේක. ප්‍රත්‍යක්ෂයෙන් දක්වාලා කියමී සිතා මෑණියන්ගේ අත අල්වාගෙන මතු මාල්තලයට නැඟී ගොස් සීමැදුරු කවුළුව හැර පිටත බලා වළන් සෝදමින් සිටි බෝධිසත්ත්වයන් දිසාවට අත දිගු කොට "මෑණියන් වහන්ස, තෙලෙ කුමාරිකාවරුන්ගේ අන්තඃපුර ආසන්නයෙහි මුළුතැන්ගෙයි මිදුලෙහි තරයේ කැසපට ගන්වා අරක්කැමි වේශයෙන් නැඹුරුව සිට වළන් සෝධන සේක් කුස රජ්ජුරුවන් වහන්සේ" යයි දැන් වූ ය.

[තුන්වැනි පිටුව බලන්න

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

එකල බෝධිසත්ත්වයෝ ප්‍රභාවතීන් නිසා සත්රජ්ජුරු කෙනෙක් මේ නුවර වටලා ගත්තාහ යි යනු අසා අද දවස් මාගේ මනෝරථය මුදුන් පැමිණෙන්නේ යයි මාගේ මේ ගමට ආ නියාව අද දවස් ප්‍රභාවතී දෙමවුපියන්ට කියන්නී ය. ඒ අසා මා ගෙන්වා ගෙන උන් මට පාවා දෙති, එකල මා ගත් දුක් සාර්ථක වන්නේ යයි වළන් සෝධා තැන්පත් කොට තබමි සිතා පැන් ගෙනවුත් වළන් සෝධන්ට පටන්ගත්හ එසඳ වළන් සෝධමින් සිටි රජ්ජුරුවන් දැක දියණියන්ට උරණව "කෙල්ල, තෝ චණ්ඩාල එකක් ද, අවශේෂ හීන ජාතියෙහි එකක් ද නොහොත් මෙබඳු රාජ වංශය නසන්ට උපන් එකක් ද මදු රජ කුලයෙහි උපන් හෝ සකල රාජ මෞලිමාණික්‍යකාන්තීන් බබළන ලද පාදපීඨ ඇති තොපගේ වල්ලභ වූ කුස රජහු ලවා දාස ක්‍රියා කරවි දැ"යි පරිභව බිණූ ය.

(i) කුස රජතුමා සාගල පුරයට පැමිණ සිටි බව පබාවතියගේ මව දැන සිටියේ යැයි පූර්වෝක්ත ඡේදයෙන් කියැවේ ද? (ලකුණු 05 යි.)

(ii) දඹදිව සියලු රජ දරුවන් කුස රජතුමාගේ දෙපා වන්දනය කළ බව කියැවෙන අවස්ථාව ඡේදයෙන් උපුටා දක්වන්න. (ලකුණු 05 යි.)

(iii) තම අභිමතාර්ථය සාධනය වන බව කුස රජු දැන ගත්තේ කෙසේ ද? (ලකුණු 05 යි.)

(iv) කුස රජතුමාගේ බලපරාක්‍රමය වර්ණනා කර ඇති ආකාරය මෙම ඡේදය ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි.)

(ලකුණු 25 යි.)

**නැතහොත්**

දකුණේ මෙන් ම උතුරේත් හිරු නගියි — උදේ
රන් තරු රිදී තරු සවසට පෙළට — ඇදේ
හඳ ඇති දාට රසබර රැස් දහර — හදේ
පොල් ගස් මුදුනෙ මෙන් තල් ගස් මුදුනෙ — වැදේ

ගෙන එයි මිහිරි ගී මදනල හමන — විට
වැටහෙයි නො වැටහුණු සැඟවුණු කරුණු — මට
නිල් පැහැයක් නැතත් මේ වැලි පොළොව — පිට
උදයට පෙනේ බොල් පිනි බිඳු පබලු — ඇට

තනි බව දැනේ එහි කවුතුක රසය — ඇත
මා පිට ගෙයක බව සලකනු පුරුදු — නැත
හැම මොහොතක ම ඇති උණුසුම් ගතිය — මත
උගතිම් කිම ද මිනිසා සතු දෙ නෙත — තෙත

ඩහදිය හෙළන අය හිරිහැර අතර — වැටී
දකුණේ මෙන් ම උතුරෙත් හැම තැනම — සිටී
විමසා බලමි ඔවුනගෙ හදවතෙහි — හැටී
කළුගල් යකඩ නො ව උණු වී හැලෙන — ඉටී

බැඳ ඇති විලංගුව පා මිණී සලඹ — කොට
සලකා වැටෙන එය බැන්දහු ඉදිරි — පිට
මිනිසුන් දකුණෙ මෙන් උතුරෙත් පෙනෙන — විට
සිහියෙන් තුරන් වෙයි හෙට යන දවස — මට

මිනිහා වෙතින් මිනිහා වෙන් කරන — රිසින්
බැඳ ඇති පවුරු පදනම් කිසි තෙනකු — විසින්
ඒවා පාඩා බිඳගෙන එහි පිරුණු — පසින්
පාලම බැඳෙනු ඇත දවසක උතුරු — දෙසින්

පැයක දී එතට හමු වන දුර ඇත — දෙතැන
මෙය වෙන් කරනු හැකි කිසිවකු වෙ ද — කොතැන
සුරුට්ටුවට එක් වී උතුරේ — ඔතන
බේදය පිලිස්සී හමු වේවා — දකුණ

(i) මෙම පද්‍ය පන්තිය නිර්මාණයේ දී කවියාගේ අපේක්ෂාව වූයේ කුමක් ද? (ලකුණු 05 යි.)

[හතරවැනි පිටුව බලන්න

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(ii) තම අත්දැකීම ප්‍රබලව ඉදිරිපත් කිරීමේ දී පරිසර වර්ණනා යොදාගත් ආකාරය පහදන්න. (ලකුණු 05 යි.)

(iii) උතුරෙත් දකුණෙත් දැකිය හැකි පොදු සමානතා මොනවා ද? (ලකුණු 05 යි.)

(iv) "මෙම පද්‍ය පන්තියෙන් කවියා විසින් අපේක්ෂා කරන ලද්දේ ජාතික සමගියයි" විමසන්න. (ලකුණු 10 යි.)

(ලකුණු 25 යි.)

## III කොටස

මෙම කොටසෙන් ප්‍රශ්න **එකකට** පමණක් පිළිතුරු සපයන්න.
(පිළිතුර වචන **150ට නො අඩු** විය යුතු ය.)

4. "බුදුන් වහන්සේ තම ඥාතීන් කෙරෙහි දැක්වූ මහා කරුණාව නන්ද මහ තෙරුන් වහන්සේගේ වස්තුවෙන් මනාව ප්‍රකට වේ." පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

5. සමකාලීන සමාජ අසාධාරණය මැනවින් නිරූපණය කිරීමට 'වැලපීම' කෙටිකතාවේ කතුවරයා දැක්වූ සාමර්ථ්‍යය අගයන්න. (ලකුණු 15 යි.)

6. "ශ්‍රී ලාංකේය ගැමි ජනතාවගේ ජීවන රටාව අව්‍යාජ විලාසයෙන් ඉදිරිපත් කිරීම තුංමංහංදිය නවකථාවේ වස්තු විෂය යි." විමර්ශනය කරන්න. (ලකුණු 15 යි.)

7. "සිරි ගුනසිංහ විසින් රචිත 'උදෑසන' පද්‍ය පන්තිය සාම්ප්‍රදායික චින්තනයෙන් බැහැර වූවකි." විමසන්න.

(ලකුණු 15 යි.)

(ලකුණු $15 \times 2 = 30$ යි.)

* * *

# 10 සහ 11 ශ්‍රේණි සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) සාමාන්‍ය පෙළ
## 11 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- [ ] 10-11 සිංහල ව්‍යාකරණ
- [ ] 10-11 සිංහල සාහිත්‍යය රසාස්වාදය
- [ ] බුද්ධ ධර්මය
- [ ] කතෝලික ධර්මය
- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] සිංහල සාහිත්‍යය සංග්‍රහය
- [ ] English Language
- [ ] ගණිතය - 1
- [ ] ගණිතය - 2
- [ ] ජීව විද්‍යාව
- [ ] භෞතික විද්‍යාව
- [ ] රසායන විද්‍යාව
- [ ] ඉතිහාසය
- [ ] ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- [ ] භූගෝල විද්‍යාව
- [ ] පුරවැසි අධ්‍යාපනය
- [ ] පෙරදිග සංගීතය
- [ ] නර්තනය
- [ ] නාට්‍ය හා රංග කලාව
- [ ] චිත්‍ර කලාව
- [ ] තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- [ ] සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
- [ ] සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
- [ ] කෘෂි හා ආහාර තාක්ෂණය
- [ ] ගෘහ ආර්ථික විද්‍යාව

## 11 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] බුද්ධ ධර්මය
- [ ] ඉතිහාසය
- [ ] ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
- [ ] පුරවැසි අධ්‍යාපනය

## Grade 11 - Short Notes

**English Medium**

- [ ] Buddhism
- [ ] Mathematics - 1
- [ ] Mathematics - 2
- [ ] Biology
- [ ] Physics
- [ ] Chemistry
- [ ] History
- [ ] Business & Accounting Studies
- [ ] Geography
- [ ] Civic Education
- [ ] ICT
- [ ] Health & Physical Education
- [ ] 10-11 English Literary (Poetry)
- [ ] 10-11 English Literary (Drama)
- [ ] 10-11 English Literary (Short Story)

## Grade 11 - Model Papers

**English Medium**

- [ ] Civic Education

## 10 ශ්‍රේණිය - කෙටි සටහන්

**සිංහල මාධ්‍ය**

- [ ] බුද්ධ ධර්මය
- [ ] කතෝලික ධර්මය
- [ ] සිංහල භාෂාව හා සාහිත්‍යය
- [ ] සිංහල සාහිත්‍යය සංග්‍රහය
- [ ] සිංහල රචනා අත්වැල
- [ ] English Language
- [ ] ගණිතය - 1
- [ ] ගණිතය - 2
- [ ] ජීව විද්‍යාව
- [ ] භෞතික විද්‍යාව
- [ ] රසායන විද්‍යාව

ඉතිහාසය
ඉතිහාසය රූප සටහන් අශ්‍රිත කෙටි සටහන්
ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 1
ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 2
භූගෝල විද්‍යාව
පුරවැසි අධ්‍යාපනය
පෙරදිග සංගීතය
නර්තනය
නාට්‍ය හා රංග කලාව
චිත්‍ර කලාව
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය
සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
කෘෂි හා ආහාර තාක්ෂණය
ගෘහ ආර්ථික විද්‍යාව
ජපන් භාෂාව

## 10 ශ්‍රේණිය - ප්‍රශ්නෝත්තර

**සිංහල මාධ්‍ය**

සිංහල භාෂාව හා සාහිත්‍යය
බුද්ධ ධර්මය
ගණිතය
විද්‍යාව
ඉතිහාසය
පුරවැසි අධ්‍යාපනය
භූගෝල විද්‍යාව
පෙරදිග සංගීතය

## පාඩමෙන් පාඩමට මාසික ඇගයීම්

**සිංහල මාධ්‍ය**

10-ශ්‍රේණිය - විද්‍යාව
11-ශ්‍රේණිය - විද්‍යාව

## Grade 10 - Short Notes

**English Medium**

Buddhism
Mathematics - 1
Mathematics - 2
Biology
Physics
Chemistry
History
Business & Accounting Studies - 1
Business & Accounting Studies - 2
Geography
Civic Education
ICT
Health & Physical Education

## Grade 10 - Model Papers

**English Medium**

Mathematics
Science
Civic Education
Geography
English Activity Book
English Work Book

## අනෙකුත් ග්‍රන්ථ

හෙළදිව කතිකාවත
- අරුණශාන්ත අමරසිංහ

හොල්මන් අවතාර සහ යකඳුරන්
- අරුණශාන්ත අමරසිංහ

සිසු-ගුරු අත්පොත නාට්‍ය හා රංග කලාව 10-11 ශ්‍රේණි සඳහා (නව විෂය නිර්දේශය) - නන්දන අල්ගේවත්ත

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන්, ප්‍රශ්න පත්‍ර කට්ටල සහ වැඩ පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.